CGL
CEYLON GOLF LEAGUE

+94 077 190 8 311
info@ceylongolfleague.com
278 Union Place, Colombo 002

# ලංකා ගොල්ෆ් ලීගය - ශ්‍රී ලංකාවේ ප්‍රථම ෆ්‍රැන්චයිස්-ආකෘතියේ ගොල්ෆ් තරඟාවලිය

ශ්‍රී ලංකාවේ ප්‍රථම ෆ්‍රැන්චයිස්-ආකෘතියේ ගොල්ෆ් තරඟාවලිය වන සිලෝන් ගොල්ෆ් ලීගය දියත් කිරීමත් සමඟ ශ්‍රී ලංකාවේ ගොල්ෆ් ක්‍රීඩාව පෙර නොවූ විරූ ලෙස ජීවමාන වීමට පටන් ගෙන තිබේ. ඓතිහාසික රාජකීය කොළඹ ගොල්ෆ් සමාජය විසින් සත්කාරකත්වය දරණ මෙම තරඟාවලිය 2025 දෙසැම්බර් 5 වැනිදා සිට 7 වැනිදා දක්වා පුරා දින තුනක් පැවැත්වෙන අතර, නවීන ෆ්‍රැන්චයිස් ක්‍රීඩාවේ ත්‍රාසය සමඟ ගොල්ෆ් සම්ප්‍රදාය මුසු කරමින් පැවැත්වෙන මෙම තරඟාවලියේදී නගර 8 ක් නියෝජනය කරමින් ජාතික කීර්තිය සඳහා ඉහළ ජවයකින් යුත් කණ්ඩායම් අටක් තරඟ වදිනු ඇත.

ලංකා ගොල්ෆ් ලීගය හරහා ගොල්ෆ් ක්‍රීඩාව ප්‍රේක්ෂකයින්ට විනෝදාස්වාදය ලබාදෙන ප්‍රදර්ශනයක් බවට පරිවර්තනය කරනු ඇති අතර, එහිදී නාගරික තරඟකාරීත්වය, සජීවී ක්‍රීඩක වෙන්දේසියක අසිරිමත් බව සහ ලෝක මට්ටමේ ආගන්තුක සත්කාරත්වය අත්විඳීමට හැකියාව ලැබෙනු ඇත. තරඟාවලියට තරඟ වදින කණ්ඩායම් වන්නේ කොළඹ, මහනුවර, නුවරඑළිය, ත්‍රිකුණාමලය, හම්බන්තොට, ගාල්ල, සීගිරිය සහ අනුරාධපුරය යි. එහිදී ක්‍රීඩක වෙන්දේසියක් හරහා ගොඩනගන ලද ලැයිස්තු සමඟින්, ෆ්‍රැන්චයිස් හිමිකරුවන් පහළ, මධ්‍යම සහ ඉහළ යන කාණ්ඩ හතක් හරහා ක්‍රීඩකයින් 14 දෙනෙකු වෙනුවෙන් ලංසු තබනු ඇත. දින තුනක් පුරා, රසිකයින්ට ෆෝබෝල් ගැටුම්, උපායමාර්ගික තරඟ සහ හරිත වර්ණ භූමිය මත අමතක නොවන අත්දැකීමක් ලබාදෙන අවසන් මහා තරඟ දැකගත හැකිය.

සියලුම ෆ්‍රැන්චයිස් කණ්ඩායම් අටම දැනටමත් පෞද්ගලික හිමිකරුවන්ට අළෙවි කර අවසන්ව ඇති අතර, එය ශ්‍රී ලංකාවේ ගොල්ෆ් ක්‍රීඩාව ඉහළ නැංවීම සඳහා ලංකා ගොල්ෆ් ලීගයේ දැක්ම කෙරෙහි ඇති උද්‍යෝගයේ සහ විශ්වාසයේ සලකුණකි. තරඟයෙන් ඔබ්බට ගොස් මෙම ලීගය උත්සවාකාර වාතාවරණයක් නිර්මාණය

CGL
CEYLON GOLF LEAGUE

+94 077 190 8 311
info@ceylongolfleague.com
278 Union Place, Colombo 002

කරනු ඇති අතර, එහිදී අද්විතීය ආගන්තුක සත්කාර අත්දැකීම්, ක්‍රීඩාංගණය තුළ විනෝදාස්වාදය සහ ක්‍රීඩකයින් මුණ ගැසී ඔවුන් හා කතා බහ කිරීමට රසිකයින්ට අවස්ථාව ලැබෙනු ඇත. ෆ්‍රැන්චයිස් ලංසු තැබීමෙන් ලැබෙන අතිරික්ත අරමුදල් ප්‍රජාවට සහ ක්‍රීඩාවේ උන්නතියට සහාය වීම සඳහා යොදවනු ඇති අතර, ඉන් ලීගයේ බලපෑම තරඟාවලියෙන් ඔබ්බට විහිදෙන බව සහතික කෙරෙනු ඇත.

මෙම ලීගය සඳහා අනුග්‍රහය දැක්වීමට ශ්‍රී ලංකා ක්‍රීඩාවේ නව යුගයක් සඳහා වන දැක්ම බෙදා ගන්නා ප්‍රමුඛ පෙළේ හවුල්කරුවන් බොහෝ දෙනෙකු එකට එක්ව තිබීමද තවත් විශේෂත්වයකි. ඒ අනුව ලීගයේ හිමිකම් හවුල්කරු ලෙස සම්පත් බෑන්ක් ප්‍රයිවට් බෑංකින් කටයුතු කරන අතර, ලීගයේ බලගැන්වීමේ හවුල්කරු ලෙස හච් ශ්‍රී ලංකා සහ ඉසව් හවුල්කරු ලෙස මාස්ටර්කාඩ් කටයුතු කරයි. මීට අමතරව ස්පිනර් ආයතනය, ශක්තිජනක පාන හවුල්කරු ලෙසද, ස්පෝර්ට්ස් නියුට්‍රිෂන් සමාගම සජලන හවුල්කරු ලෙසද, මරීනා ස්ක්වෙයාර් සමාගම දේපළ හවුල්කරු ලෙසද, මූල්‍ය සේවා හවුල්කරු ලෙස එම්පවර් කැපිටල් ආයතනයද, ඔටෝමොබයිල් හවුල්කරු ලෙස ඉසුසු ආයනයද, ආගන්තුක සත්කාර හවුල්කරු ලෙස සිනමන් ග්‍රෑන්ඩ් කලම්බෝ ආයතනයද කටයුතු කරන අතර, තාක්ෂණ හවුල්කරු ලෙස කටයුතු කරන්නේ ඊවිස් ආයතනයයි.

මෙම ලීගය ගැන අදහස් දක්වමින් එහි කොටස්කරුවෙක් මෙන්ම ක්‍රිකට් ලාංකීය ක්‍රීඩාවේ පුරාවෘත්තයක්ද වන මහේල ජයවර්ධන පැවැසුවේ ''සිලෝන් ගොල්ෆ් ලීගය යනු ශ්‍රී ලංකාවේ ගොල්ෆ් සඳහා නැවුම් පරිච්ඡේදයක්. ඒ වගේම ෆ්‍රැන්චයිස් ක්‍රීඩාවේ උද්‍යෝගය සමඟ සම්ප්‍රදාය මුසු කරන තරඟාවලියක්. එය අද්විතීය ක්‍රීඩාවක් සමඟ පෙළගැසීමට, ඉහළ වටිනාකමක් ඇති ප්‍රේක්ෂකයින් සමඟ සම්බන්ධ වීමට සහ ක්‍රීඩාවේ ප්‍රවේශය වර්ධනය කිරීම සඳහා කාර්යභාරයක් ඉටු කිරීමට ආයතනික සමාගම්වලට ලැබෙන අද්විතීය අවස්ථාවක්. ෆ්‍රැන්චයිස් අටක් දැනටමත් සම්බන්ධ වී සිටිනවා. ඒ නිසා සම්බන්ධ වන

+94 077 190 8 311
info@ceylongolfleague.com
278 Union Place, Colombo 002

සැමට තරඟකාරිත්වය, කීර්තිය සහ දිගුකාලීන වටිනාකමක් ලබා දෙන ලීගයක් සඳහා වේදිකාව සැකසෙනවා'' යනුවෙනි.

ලීගයේ නිල මාධ්‍ය හමුව 2025 අගෝස්තු 19 වැනි සඳුදා සවස 4:00 සිට සවස 6:00 දක්වා කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ චියර්ස් පබ් හිදී පැවැත්වෙන අතර, එහිදී කණ්ඩායම්, වෙන්දේසිය සහ තරඟ වාරය පිළිබඳ වැඩි විස්තර එළිදක්වනු ඇත. දෙසැම්බර් මාසය පැමිණෙන විට, ශ්‍රී ලංකාවේ පළමු ෆ්‍රැන්චයිස් ගොල්ෆ් ශූරයන් කිරුළු පැළඳීමත්, ක්‍රීඩාවේ නව යුගයක් ආරම්භ වීමත් සිදුවනු ඇත.